# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1868/64 – 2014 ජුනි 27 වැනි සිකුරාදා – 2014.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ව/18/54/2001.

ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් චන්දිමා දිසානායක වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම අත්කර ගැනීම සඳහා නියමිත පොළී මුදල වන රුපියල් තුන්දහස් හාරසිය තිස්අටයි ශත පනස්හතක් (රු. 3438.57) අයිතිකරුවන්ට ලබා ගැනීම පිණිස ගම්පහ දිස්ත්‍රික් අධිකරණයේ නඩු අංක 575/ ඉඩම් අත්පත් යටතේ බැර කර ඇති බව මෙයින් දන්වමි.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්.
වත්තල.

2014 මැයි මස 12 වැනි දින.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | ඉඩමේ නම | : | වරි. අංකය නොමැති දෙහිගහවිල |
| | පිඹුරු අංකය | : | මු.පි.ගම්. 3405 |
| | කැබලි අංකය | : | 04 |
| | ප්‍රමාණය | : | හෙක්. 0.0038 |
| | පිහිටීම | : | බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැලතුර ගමේ |

07 - 367

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ම/සං/2/උසාවි තැන්පත්.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1838/50 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මගේ අංක ම/සං/2/උසාවි තැන්පත් හා 2013.10.29 දිනැති 33 වැනි වගන්තිය යටතේ දැන්වීමේ සඳහන් මු.පි.ගම්.3653 හි කැබලි අංක 03 දරන ඉඩම් කැබැල්ලේ භූමි ප්‍රමාණය ප්‍රමාද දෝෂයකින් හෙක්. 0.0017 ලෙස සඳහන්ව ඇති අතර එය හෙක්. 0.0077 ක් වශයෙන් නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

තමරා ඩී පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්.
මහර.

2014 ජුනි මස 05 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 368/1

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ම/සං/2/උසාවි තැන්පත්.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 1812/32 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මගේ අංක ම/සං/2/උසාවි තැන්පත් හා 2013.06.01 දිනැති 33 වැනි වගන්තිය යටතේ දැන්වීමේ සඳහන් මු.පි.ගම්.3801 හි කැබලි අංක 34 දරන ඉඩමේ නම සඳහන්ව ඇත්තේ පෙලන්ගහවත්ත ලෙසය. එය අලුබෝගහකුඹුර හෙවත් ගලබඩකුඹුරේ පිල්ලෑව වශයෙන් නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

තමරා ඩී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2014 ජූනි මස 05 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 368/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.